ලංසු සඳහා ආරාධනයයි

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

තංගල්ල ධීවර වරායේ නව වෙන්දේසි ශාලාව ඉදිකිරීම

කොන්ත්‍රාත් අංකය : CFHC/PD/CAH/TNG/2026-108

1. **"ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව"** වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපති විසින් ඉහත සඳහන් කාර්යය සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුදු, තැබූ ලංසු කැඳවනු ලැබේ. මෙම කාර්යයට නව වෙන්දේසි ශාලාවක් ඉදිකිරීම සහ එය ආරක්ෂිත සහ ක්‍රියාකාරී තත්ත්වයට පත්කිරීම ඇතුළත් වේ. අනපේක්ෂිත වියදම් සහ වැට් (VAT) බදු රහිතව ඉංජිනේරු ඇස්තමේන්තුවේ වශයෙන් පිරිවැය **මිලියන 21.3** කි.

2. ජාතික තරඟකාරී ලංසු ක්‍රමය මගින් ලංසු කැඳවේ.

3. ලංසුකරු පහත සඳහන් යෝග්‍යතා නිර්ණායකයන්ට අනුකූල විය යුතුය.:

   - ලංසුකරු අසාධු ලේඛනගත අයෙකු නොවිය යුතුය.
   - ලංසු ඉදිරිපත් කරන අවස්ථාව වන විට ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ C4, C5 හෝ C6 ශ්‍රේණියක් යටතේ CIDA හි ලියාපදිංචිවී තිබිය යුතුය.

4. ලංසුකරු පහත සඳහන් සුදුසුකම් නිර්ණායකයන්ට අනුකූල විය යුතුය:

   - පසුගිය වසර පහ තුළ (2019, 2020, 2023, 2024, 2025) ඉටුකරන ලද ඉදිකිරීම් වැඩවල සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම අවම වශයෙන් ශ්‍රී ලංකා රුපියල් **මිලියන 21.3** ක් විය යුතුය.
   - පසුගිය වසර 10 ඇතුළත, ප්‍රධාන කොන්ත්‍රාත්කරු ලෙස මෙම කාර්යයන්ට සමාන ස්වභාවයකින් සහ සංකීර්ණතාවයෙන් යුත් කොන්ත්‍රාත්ත දෙකක් (2) ඉදිකිරීමේ පළපුරුද්ද (මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා, සඳහන් කරනු ලබන කාර්යයන් අවම වශයෙන් 70%ක් වත් සම්පූර්ණ කර තිබිය යුතුය). ශ්‍රී ලංකා රුපියල් **මිලියන 14.9**
   - ව්‍යාපෘතිය අවසන් වන දිනය දක්වා, අනෙකුත් කොන්ත්‍රාත්තු වගකීම් සහ මෙම කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීමට සිදුවන ඕනෑම අත්තිකාරම් මුදලක් හැර තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් සහ/හෝ ණය පහසුකම් ප්‍රමාණය ශ්‍රී ලංකා රුපියල් **මිලියන 21.3** කට නොඅඩු විය යුතුය.
   - ටෙන්ඩර් කළ හැකි අගය රුපියල් **මිලියන 5** ඉක්මවන සෑම ලංසුවක් සඳහාම, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වැනි වගන්තියට අනුකූලව පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද වලංගු සහතිකයක් ලංසුකරු සතුව තිබිය යුතුය. මෙය කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකමකි.

5. මෙම ලංසුව සඳහා ඉදිකිරීම් කාලසීමාව **ලිත් දින 150** ක් වන අතර හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල ධීවර වරායේ ව්‍යාපෘතිය පිහිටා ඇත.

6. උනන්දුවක් දක්වන තනි හෝ ඒකාබද්ධ ව්‍යාපාරික ලංසුකරුවන්ට, **011-2527439** යන දුරකථන අංකය ඔස්සේ **"ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15"** හි පිහිටි සිවිල් ඉංජිනේරු අංශයේ, සිවිල් ඉංජිනේරු කළමනාකරු වෙතින් වැඩදුර තොරතුරු ලබාගත හැකි අතර, **"ප්‍රසම්පාදන අංශය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15"** හි පිහිටි කාර්යාලයේදී ප්‍රසම්පාදන ලේඛන (නොමිලේ) පරීක්ෂා කර බැලිය හැක.

7. ආපසු නොගෙවනු ලබන ගාස්තුව **රු. 5,000.00** ක් ගෙවීමෙන් අනතුරුව කොළඹ 15, රොක් හවුස් පටුමග, අංක 15, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, ප්‍රසම්පාදන කළමනාකරු වෙත ආයතනික ලිපි ශීර්ෂයක් යටතේ කරනු ලබන ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් **2026.10.06 සිට 2026.10.27** දක්වා ඕනෑම වැඩකරන දිනක **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00** දක්වා, උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිල දී ගත හැක.

8. ලංසු **2027.01.12 දක්වා (ලිත් දින 77)** වලංගු විය යුතුය.

9. සියලුම ලංසු සමඟ රුපියල් ලක්ෂ තුනක **(රු. 300,000.00)** ලංසු විවෘත කරනු ලබන දින සිට **2027.02.07** දක්වා **(ලිත් දින 105)** වලංගු ලංසු ඇපකරයක් (බැංකු ඇපකරයක් හෝ ආපසු ගෙවනු ලබන මුදල් තැන්පතුවක්) ඉදිරිපත් කළ යුතුය. මුදල් තැන්පතු පත්‍රිකාවේ මුල් පිටපත ලංසුව සමඟ අමුණා තිබිය යුතුය.

10. මුදු, තැබූ ලංසු අනු පිටපතක් සහිතව, **2026.10.28** දින **පෙ.ව. 11.00** ට හෝ ඊට පෙර **"සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ප්‍රසම්පාදන අංශය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15"** වෙත ගෙනවිත් භාරදිය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, සහභාගී වීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ. (ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගී වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ).

11. පූර්ව ලංසු රැස්වීම **2026.10.14** දින **පෙ.ව. 11.30** ට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15 හි දී පැවැත්වේ.

12. සියලුම ලංසුකරුවන් CIDA/SBD/01, දෙවන මුද්‍රණය, 2007 ජනවාරි (පෙර ICTAD/SBD/01) ලේඛනය සැලකිල්ලෙන් කියවන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15.